| සංකල්පය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **පූර්ව ගණිත සංකල්ප** | **1.0 පූර්ව ගණිත සංකල්පවලට අදාළ ක්‍රියාකාරකම්හි නිරත වෙයි.** | |
| | 1.1 හැඩය, තරම හා වයනය අනුව ද්‍රව්‍ය තෝරා වෙන් කළ ආකාරය විස්තර කරයි. | • ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් උපලක්ෂණයක් (හැඩය, තරම සහ වයනය) අනුව හේතු දක්වමින් ගොඩවලට වෙන් කිරීම. |
| | 1.2 හැඩය, තරම අනුව රූප තෝරයි | • රූප පත්‍රිකා කට්ටලයක ඇති රූප වරකට එක් උපලක්ෂණයක් (හැඩය හා තරම) අනුව හේතු දක්වමින් ගොඩවලට වෙන් කිරීම |
| | 1.3 බහු-ඒක සම්බන්ධතා හඳුනා ගනියි. | • කිහිප දෙනකු එක් කෙනෙකුට හෝ කිහිප දෙනකු එක් ද්‍රව්‍යයකට හෝ ද්‍රව්‍ය කිහිපයක් එක් කෙනකුට හෝ එක් ද්‍රව්‍යයකට හෝ අනුරූප වන ආකාරයේ සම්බන්ධතා හඳුනා ගැනීම |
| **සංඛ්‍යා සංකල්ප** | **2.0 ද්‍රව්‍ය/රූප ගණන් කරයි.** | |
| | 2.1 එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 50ක් ගණන් කරයි.<br>2.2 එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 100ක් ගණන් කරයි. | • එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 100ක් ගණන් කිරීම. |
| | 2.3 එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප 100ට අඩු සංඛ්‍යාවක් දෙකෙන් දෙක ගණන් කරයි. | • එක ම වර්ගයේ ද්‍රව්‍ය/රූප (100ට අඩු සංඛ්‍යාවක්) දෙකෙන් දෙක ගණන් කිරීම. |
| | **3.0 සංඛ්‍යා හඳුනාගෙන භාවිත කරයි.** | |
| | 3.1 1 සිට 9 තෙක් සංඛ්‍යා කියවයි, ලියයි.<br>3.2 20 තෙක් සංඛ්‍යා කියවයි, ලියයි. | • 100 තෙක් සංඛ්‍යා කියවීම, ලිවීම, සංඛ්‍යා නාමය ලිවීම |
| | 3.3 50 තෙක් සංඛ්‍යා කියවයි, ලියයි. | • 1 සිට 50 තෙක් සංඛ්‍යා කියවීම. ලිවීම. |
| | 3.4 100 තෙක් සංඛ්‍යා කියවයි, ලියයි. | • 1 සිට 50 තෙක් සංඛ්‍යාංක හා සංඛ්‍යා නාමය නිවැරදි ව ලිවීම. |
| | 3.5 ශූන්‍යය "0" හඳුනාගෙන භාවිත කරයි. | • ශූන්‍යය සංකල්පය හඳුනාගෙන භාවිත කිරීම |

| සංකල්පය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | 3.6 ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙහි ස්ථානීය අගය දක්වයි. | • ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක එක් එක් ඉලක්කමෙහි ස්ථානීය අගය දැක්වීම |
| | 3.7 100ට අඩු ඕනෑ ම සංඛ්‍යා තුනක් සසඳා පටිපාටිගත කරයි. | • 100ට අඩු සංඛ්‍යා විශාල/කුඩා ලෙස සැසඳීම<br>• 100ට අඩු ඕනෑම සංඛ්‍යා තුනක් පටිපාටිගත කිරීම |
| | **4.0 සංඛ්‍යා රටා ගොඩනඟයි.**<br>4.1 රූප/සංඛ්‍යා රටා ගොඩනඟයි.<br>4.2 පොදු අන්තරය 2 වන සංඛ්‍යා රටා ගොඩනඟයි. | • පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටා |
| **ගණිත කර්ම** | **5.0 සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳයි.**<br>5.1 එකතුව 9 තෙක් වන සංඛ්‍යා එකතු කරයි.<br>5.2 එකතුව 20 තෙක් වන සංඛ්‍යා එකතු කරයි.<br>5.3 එකතුව 99ට නොවැඩි වන සංඛ්‍යා එකතු කිරීමේ සරල ගැටලු විසඳයි. | • එකතුව 99ට නොවැඩි වන සංඛ්‍යා දෙකක් ගෙනයාම් රහිත ව එකතු කිරීමේ සරල ගැටලු විසඳීම. |
| | **6.0 සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි.**<br>6.1 9ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කරයි.<br>6.2 20ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කිරීමේ ගැටලු විසඳයි.<br>6.3 99ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කිරීමේ ගැටලු විසඳයි. | • 99ට නොවැඩි සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කිරීමේ (ගෙන ඒම රහිත ව) සරල ගැටලු විසඳීම. |
| **මිනුම්** | **7.0 දිග මැනීම ආශ්‍රිත ගැටලු විසඳයි.**<br>7.1 අභිමත ඒකක භාවිතයෙන් දිග/උස මනියි.<br>7.2 දිග/උස මැන සසඳයි. පටිපාටිගත කරයි. | • අභිමත ඒකක භාවිතයෙන් දිග/උස තුනක් මැනීම; සැසඳීම; පටිපාටිගත කිරීම. |

| සංකල්පය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | **8.0 බර මැනීම ආශ්‍රිත ගැටලු විසඳයි.**<br>8.1 විවිධ වස්තුවල බර සසඳයි.<br>8.2 අභිමත ඒකක භාවිතයෙන් බර මනියි. සසඳයි. | • අභිමත ඒකක භාවිතයෙන් වස්තුවල බර මැනීම. සැසඳීම. |
| | **9.0 පරිමාව හා ධාරිතාව ඇතුළත් ගැටලු විසඳයි.**<br>9.1 අභිමත ඒකක භාවිතයෙන් ද්‍රව ප්‍රමාණ මනියි. සසඳයි.<br>9.2 අල්ලන ද්‍රව ප්‍රමාණය අනුව බඳුන්වල ධාරිතාව සසඳයි. පටිපාටිගත කරයි. | • අභිමත ඒකක භාවිතයෙන් ද්‍රව ප්‍රමාණ මැනීම; සැසඳීම.<br>• බඳුන් දෙකක ධාරිතාව සැසඳීම<br>• අල්ලන ද්‍රව ප්‍රමාණය අනුව බඳුන් තුනක් පටිපාටිගත කිරීම |
| | **10.0 මිනිත්තු, පැය, දවස්, සති හා මාස අතර සම්බන්ධතා හඳුනා ගෙන භාවිත කරයි.**<br>10.1 විවිධ ක්‍රියාකාරකම්හි නිරත වීමෙන් කාලය ගත වීම හඳුනා ගනියි.<br>10.2 සතියේ දවස්වල නම් නිවැරදි ව භාවිත කරයි. | • කාලය ගත වීම හඳුනා ගැනීමට විවිධ ක්‍රියාකාරකම්හි නිරත වීම.<br>• සතියේ දවස්වල නම් නිවැරදි ව භාවිත කිරීම |
| **මුදල්** | **11.0 මුදල් භාවිතය හා ගනුදෙනු ආශ්‍රිත ගැටලු විසඳයි.**<br>11.1 කාසි භාවිතයෙන් සරල ගනුදෙනුවල නිරත වෙයි. | • රුපියල/රුපියල් 2/රුපියල් 5/ රුපියල් 10 උපයෝගී කරගෙන සරල ගනුදෙනුවල යෙදීම |
| **හැඩ හා අවකාශය** | **12.0 ඝන වස්තු හා ජ්‍යාමිතික හැඩතලවල ලක්ෂණ හා ස්වභාවය හඳුනාගෙන ක්‍රියාකාරකම්හි නිරත වෙයි.**<br>12.1 ජ්‍යාමිතික හැඩ නම් කරයි.<br>12.2 ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ විස්තර කරයි. | • පරිසරයේ ඇති සරල ජ්‍යාමිතික හැඩ නම් කිරීම<br>• සරල ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ විස්තර කිරීම. |
| | **13.0 හැඩ හා අවකාශය පිළිබඳ හැකියා භාවිත කරයි.**<br>13.1 ඝනවස්තු හා හැඩතල ආශ්‍රිත විවිධ නිර්මාණවල නියැළෙයි. | • ඝන වස්තු හා හැඩතල ආශ්‍රිත විවිධ නිර්මාණ කිරීම<br>• ඝන වස්තු හා හැඩතල ආශ්‍රිත ක්‍රියාකාරකම් මඟින් අවකාශය පිළිබඳ අත්දැකීම් ලැබීම |